"හැදිමිටේ නුවණ"

සිංහලෙන් කතා කරන අමෙරිකානු මහාචාර්යවරියක්.....

ලොව මියයන භාෂාවන් අතරින් එක් භාෂාවක් ලෙස සිංහල භාෂාව හඳුවන්නට අපේ ම අය පසුගිය කාලයක උත්සාහ වුණා. එහෙත් පරිණාගක තාක්ෂණයත් ඒ හා බඳුණ තොරතුරු තාක්ෂණයත් අනුව නව පිබිදීමක් ලොව පුරා විප්‍රවාසීව සිටින හා වෙබ්මම සිටින ඇසැමි පිරිස් අතර දක්නට ලැබෙනවා. සිංහල වචන ශබ්දවන ආකාරය අනුව ඉංග්‍රීසි අකුරින් යතුරු ලියනය කිරීමට අපගේ අය අතර උත්සාහවක් ඇතිවූයේ වඳුළු හැසෙළ සහ ජංගම දුරකතන පාවිච්ච නිසා යයි කියන්න පුළුවන්. "සිංග්ලිෂ් " (Singlish) නමින් පසුකාලීනව නම කෙරුන මේ මුසුව " සිංගිරිසි" යනුවෙන් ගීත නිර්මාණයකට පවා ඇතුළත් වූයේ වසර 2000 දී පමණ.

අපගේ මේබස වහරණ, ඒ හැකියාව පවත්වාගෙන යන දෙමළ හිතවතුන් අපහට විදේශයන්හිදී මුණ ගැහෙනවා. සිංහලය වහරණ සුදු ජාතිකයින් පවා හමුවන අවස්ථා නැතිවො නොවේ. එහෙත් අපගේ භාෂාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් තරමක් දුරට හෝ උගෙන, මේ බිමේ සාමාජික තොරතුරු ඇසුරින් පර්යේෂණ කරනා මහාචාර්යවරියක අපට හමුවුණේ මුළුවතාවට.

ඇමෙරිකාවේ ඔරගන් (Oregon) ප්‍රාන්තයේ " පෝට්ලන්ඩ් ස්ටේට්" (Portland State) විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරියක වන අච්චර්ය මිචෙල් රූත් ගැම්බර්ඩ් මහත්මිය (Professor Michele Ruth Gamburd) අපට හමුවන්නේ රාජ්‍ය සම්මාන ලාභී ප්‍රවීන ගත් කතුවරියක වන ස්වර්ණකාන්ති රාජපක්ෂ මහත්මියගේ මෙල්බන් නිවහනේදීය. මහාචාර්යවරිය සිංහල කතාවට හැකියාවක් දක්වන්නා සේම සරල දේ කියැවීමටත්, කෙටියෙන් ඔව්මටත් හැකියාව දක්වනවා. මේ වන විට ඉංග්‍රීසි බසින් ග්‍රන්ථ පහක් එළිදැක්වා ඇති මහාචාර්යවරියගේ ග්‍රන්ථ තුනක් රාජපක්ෂ මහත්මිය සිංහලටත් තනා තිබෙනවා.

වසර 1987 දී ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය විෂය හදාරා මුල් උපාධිය ලබා ගන්නා මහාචාර්යවරිය, 1989 දී ඩික්ස්ෆෝඩ් විශ්ව විද්‍යාලයෙන් දර්ශනය හා දේවත්වය පිළිබඳව උපාධියත්, 1991 දී මිචිගන් විශ්ව විද්‍යාලයේන් මානව වංශ විද්‍යාව පිළිබඳව සාස්ත්‍රපති උපාධියක් 1995 දී එම විශ්ව විද්‍යාලයෙන් ම මානව වංශ විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියත් ලබා ගන්නවා. අප අය සමග පිළිසඳරට එක්වුණේ සිංහලයෙන්.

අය මුළිකව හාදාරන විෂය ක්ෂේත්‍රය කුමක්ද කියලා දැන ගැනීමට අප මුළින්ම යොමුවුණා.

"මගේ විෂය වෙන්නේ මානව වංශ විද්‍යාව. මේ විෂය ක්ෂේත්‍රයේ කොටස් හතරක් තියෙනවා. පළමු වැනි කොටස තමයි "ලිංග්විස්ටික් " (Linguistic). දෙවෙනි එක "ආචියෝලොජි" (Archaeology). තුන්වන කොටස පිසිකල් ඇන්ඩ් බයොලොජිකල් අන්තෘපොලොජි (Biological & Physical Anthropology) කියනවා. හතරවෙනි කොටස තමයි කල්චරල් අන්තෘපොලොජි (Cultural Anthropology)"

ස්වර්ණකාන්ති මහත්මිය විෂයයන් විස්තර කරමින් :

"මානව වංශ විද්‍යාවට ඉංග්‍රීසියෙන් කියන්නේ අන්තෘපොලොජි (nthropology) කියලා. එතකොට ලිංග්විස්ටික් අන්තෘපොලොජි (LinguisticAnthropology) කියලා කියන්නේ මානව වංශ විද්‍යාවේ භාෂා විද්‍යාත්මක කොටස. එතකොට එකි කියෙන පුරාවිද්‍යාත්මක පැත්ත තමයි ආචියෝලොජි අන්තෘපොලොජි කියලා හඳුන්වන්නේ, පිසිකල් අන්තෘපොලොජි (PhysicalArchaeology) කියන්නේ මනුෂ්‍යයාගේ පරිණාමය පිළිබඳව කියැවෙන කොටස. එතකොට කල්චරල් අන්තෘපොලොජි කියන්නේ සමාජ විද්‍යාත්මක කොටස. ඒ කියන්නේ සංස්කෘතිකමය පැත්ත හැදෑරීමයි."

මිචෙල් මහත්මිය නැවතත් අපට එක්වෙමින් :

"කල්චරල් අන්තෘපොලොජි" තමයි මගේ ප්‍රියතම කොටස. ඒ මිනිස්සුන්ගේ ගති පැවතුම් ගැගෙන ඉගෙන ගන්න එකයි."

මේ විෂය ධාරාවට මිසෙල් රූත් ගැම්බර්ඩ් මහාචාර්යවරිය යොමු වූ ආකාරය පිළිබඳවත්

සිසිර දිසානායක

අපගේ අවධානය යොමුවුණා.:

"මගේ අම්මත් ආචාර්ය උපාධියට කළේ මානව විද්‍යාව. මං කුඩා කාලයේදීයි අම්මා ඒ උපාධියට අවශ්‍ය පර්යේෂණ කළේ. ඉතින් මට මානව විද්‍යාව එපා වුණා. ඒ නිසා මම මුළින්ම විශ්ව විද්‍යාලයට ගිහින් තෝරාගන්නේ "ඉංග්ලිෂ් ලිටරේචර්" (English Literature). ඒ අනුව අයගේ මුළිම විෂය වන්නේ ඉංග්‍රීසි සාහිත්‍යයයි.

මගේ දෙවෙනි කලා උපාධිය වුණේ "ෆිලෝසෆි ඇන්ඩ් තියෝලොජි (Philosophy & Theology& කියන උපාධියයි. ඊට පස්සෙයි සමාජ විද්‍යාව පැත්තට තනුමුරුවෙලා ආචාර්ය උපාධිය කළේ. ඉතින් ඒ සඳහා යම්කිසි පර්යේෂණයක් කරන්න වෙනවා කොහේහරි ගිහින්. අම්මාවත් ඒ අත්දැකීම් ලැබුණේ ලංකාවෙන් ඉතින් මෙත් අම්මාවගේ ලංකාවට ඇවිල්ලා ඉගෙන ගත්තා."

මහාචාර්ය මිසෙල් රූත් ගැම්බර්ඩ් මහත්මිය සිය පර්යේෂණ කටයුතුවලට තෝරාගන්නේ ශ්‍රී ලංකාව. විශේෂ හේතු තිබුණද මේ තෝරාගැනීමේ? නැතහොත් සිය මව් අනුව යාමක් පමණක් ද මේ?

"අම්මා සිරත් විරිත් හැන ඉගෙන ගන්න ගොඩක් කැමැත්තෙන් හිටියේ. අයය මුළින් යන්න හිටියෙ ඊබෙව් රටට. ඒත් රටේ ඒ අවස්ථාල තිබුණ තත්වය නිසා ඒ අදහස අත හරින්න අයයට සිදුධ වුණා. අයගේ නේවාසිකාගාරයේ හිටිය ලංකාවේ යෙහෙළියක් තමයි අයයට ලංකාව තෝරගන්න යෝජනා කළේ. ඒ නෝනගේ ගෙදර ඉඳග් තමයි අම්මගේ පර්යේෂණවලට මග කරන හොඳ ගමක් හෙවිලේ. ඉතින් අම්මට හම්බවුණ ගම හරිම හොඳයි. පන්සලක් තියෙනවා, කුරුඳු වතු තියෙනවා, ගෙවල් ගොඩක් තියෙනවා, හොඳ මිනිස්සුත් ඉන්නවා." අයය සිංහල බස උපුරුවමින් කරපා මේ පසාදිලි තිරිම සාබැවින්ම ඉතාම ප්‍රියජනකයි. මේ ගම පිළිබඳව කතාකිරීමේදීයි අයයගේ කතාවට ස්වර්ණකාන්ති රාජපක්ෂ නම් වන තුමිකාව අවතීරණ වෙන්නේ. මිචෙල් මහත්මිය අය අමතන්නේ "කාන්ති අක්කා" නමින්.

"මේ ගමේ නම එළි කරන්න බෑ. මොකද මේවාගේ පර්යේෂණ කටයුතුවලදී රහින්න වෙන අවාර ධර්මවෙලා පටහැණි වනනිසා. ඒ තොරතුරු හෙළි කිරීම සාදාචාරාත්මක වෙන්නේ නෑ. මේ ගම අම්බලන්ගොඩ නගරයට ආසන්න මුහුදුබඩ ගම්මානයක්, අක්කිතට ම මිචෙල්ගේ ගෙදර අතුළු ඒ පවුල ගමට හිතවත්වුණා; ලෙන්ගතු වුණා. අවුරුදු දෙකකට පමණ පසුව ආපසු ගියත් වරින් වර ඇවිත් ඒ සම්බන්ධතාවයත් පවත්වා ගෙන ගියා. ඉතින් මිසෙල් මහත්මියත් තමන්ගේ පර්යේෂණ කටයුතුවලට මේ ගමම තෝරා ගන්නේ ඒ බැඳීම නිසා වෙන්න ඇති." ස්වර්ණකාන්ති රාජපක්ෂ මහත්මිය ඒ පසුබිම පහැදිලි කළා.

මුළ් වරට මවත් සමග ලංකාවට පැමිණෙන විට මිචෙල් දැරියගේ වයස අවුරුදු දෙකක් පමණයි. මේ ආතාමයෙන් මේ ගමට බැඳුණ අය පසුකාලය යළිත් පැමිණ කළ කී දේ පිළිබඳව අප විමසිලිමත් වුණා.

"1991 ද ආයෙත් ගමට ආවා. ඒ ආව වෙලාවේ කැළණිය විශ්ව විද්‍යාලයේදී මම සිංහල ටිකක් මුළින් ම ඉගෙන ගත්තා. අම්මා ගමේ හිටිය කාලෙන් පස්සේ මම වෙනස් වෙලා තියෙන හැටි දිනා බලන්නකොට උඩට ආව එක මානකාවක්. ගමේ නෝනලා ගොඩක් මැද පෙරදිග යනවා. රට ගිහින් ගමට සල්ලි එවනවා. ඉතින් ඒ හැන හොයලා බලලා පී.එච්.ඩී. උපාධියට පර්යේෂණය කළා. ඒ පර්යේෂණය එක්ක කරපු පොත තමයි, "ද කිචන් ස්පූන්ස් හැඩල් " (The Kitchen Spoon's Handle-Transnationalism and Sri Lanka's migrant Housemaids) ඒ පොත ස්වර්ණකාන්ති රාජපක්ෂ මෙහෙම්ය පරිවර්තනය කළා. "හැඳිමිටේ නුවණ" කියනනමින්.

මේ පරිවර්තනය "හැඳිමිටේ නුවණ" නමින් හැඳින්වීමට ස්වර්ණකාන්ති රාජපක්ෂ කතුවරිය සිතුවේ කිමදැයි කෙනෙහුට සිතෙන්න පුළුවන්.

"මේ පොතේ නම වෙන්නේ සංක්‍රමණික ජාතිකත්වය සහ ශ්‍රී ලංකාවේ විනාශකිය ගෘහ සේවිකා වෘත්තීය " හැඳිමිටේ නුවණ" කියලා මිචෙල් උපමානකාවක් යෙදුවා, අපේ රටේ ජනප්‍රිය වහරක් තියෙනවානේ, " ගැහැණුන්ගේ නුවණ හැඳිමිටේ දිගයි" කියලා. මිචෙල්ට කියන්න ඕන කළේ ඒක එහෙම ගෙවෙයි, ඔවුන් දුර දිග බලලා වටයුතු කරන පිරිසක්ය කියන එක."

මිචෙල් රූත් ගැම්බර්ඩ් මහාචාර්යවරියගේ දෙවන පර්යේෂණයට අදාල කරුණු හොනු වූ අන්දම සැබැවින්ම දෛවෝපගතයි.

"මම මත්වූවා පිළිබඳව පර්යේෂනය කරන්න පටන් ගත්තා. සුනාමි එක ආවා හේදු 2004 දී. ඉතින් ඒ සුනාමි එක ඇවරන්න වෙන මාතෘකාවක් තිබුණෙ නෑ. ඒ නිසා මගේ ඊළුත මාතෘකාව වුණෙත් සුනාමිය ම යි. ඒ පර්යේෂනය අනුව කරපු පොත තමයි " ද ගෝල්ඩන් වේව්" (The Golden Wave - Culture and Politics after Sri Lanka's Tsunami Disaster) ඒ පොතත් ස්වර්ණකාන්ති රාජපක්ෂ මහත්මිය සිංහලයට පෙරළුවා." 2004 දෙසැම්බර් 26 දින නැගුණ උදුම් රළ අසුරින් ඛියවුණ මේ ග්‍රන්ථය ස්වර්ණකාන්ති රාජපක්ෂ කතුවරිය මේ පරිවර්තනය කරවමින් නම් කරනවා " ස්වර්ණ තරංගය කියලා.....

"මිසෙල්ට මින කරපු කම තමයි "රත්තරන් රැල්ල" කියන කම. මිනිස්සුන්ට දුක් පීඩා නොනව ගිහි රැල්ලක් වුණාට පසුකාලීනව බේරුණ අයට වාසි සහගත තත්වයක් ඇතුණා. මොකද අනන්ත අපූමාණ විදේශාධාර ප්‍රමාණයක් ලැබුණා නිසා. බේදවාචකයක් කියන දැක්ම වෙනස් වුණා මිනිස්සුන්ගේ. මම එක හරිද වැරදිද කියන්න උත්සාහ කරන්නේ නෑ. නමුත් ද්‍රව්‍ය හා මූලාමය ආධාර ලබා ගත්තා අපේ අය අවශ්‍ය විදියට වගේ අතවශ්‍ය විදියටත්. මේ ආව රත්තරන් රැල්ලක් බවට පත්වුණා මේ විපතින් බේරුණ බොහෝ අයට. ඒ දිනා උපනායයෙන් බැඳිමතුත් වෙනවා මේ මාතෘකාව. පොත අළුළිසේ දී සහභැලුවට ලක් වෙයි කියලා හිතපු නිසයි "ස්වර්ණ තරංග" නම මම යෝජනා කළේ. යම්කිසි කාලයෙ බවතුත් එසැමුණා ඒ තමට."

මහාචාර්ය මිචෙල් රූත් ගැම්බර්ඩ් මහත්මියගේ නෙවන පර්යේෂණයත්, ඒ සම්බන්ධව එළි දක්වුණ හිබන්ධයත්, එකි පරිවර්තනයත් පිළිබඳව ලබනවර "සන්නසෙන් " කියවමු.

මේ සාකච්ඡාවේ හඬ පටයට සවන් දෙන්නට
www.shanidaa.com අඩවියට ගොඩවන්න

පරිසරය නිවැරදිව දකිමු

දයාරත්න විරසේකර

ඇස් ගොඩගේ ප්‍රකාශනයකි

දිනෙන් දින විවිධාකාර ස්වභාවික විනාශ පිළිබඳව අසන්නට අපට සිදු තිබේ. මේ ස්වභාවික විනාශ පිටුපස ඇත්තේ මිනිසා වසින් පරිසරයට කරනු ලබන විවිධාකාර අත පෙවීම් නිසා ඇතිවූ විෂමතා යයි මතයක් සමාජය පුරා පැතිරී අසත. ඒ නිසාම පරිසරය පිළිබඳව වැඩි අවධානයක් මේ කාලයේ යොමුවී තිබේ යයි කීවොත් එය නිවැරදිව ය.

පරිසරය පිළිබඳව ලියැවුණ පොත් පත් ඉංග්‍රීසියෙන් තියවන්නට අපට හැකියාව තිබුණද ඒ විෂය වෙනුවෙන් සිංහල භාෂාවෙන් පොත් පත් ලියැවෙන්නේ නැති තරම් ය. එය විශාල අඩුවකි.

සන්නසට "ආ මග සටහන්" ලිපි පෙළ ලියන දයාරත්න විරසේකර මහතාගේ "පරිසරය නිවැරදිව දකිමු" පොත මුද්‍රණයෙන් නිකුත් වී තිබෙන්නේ පරිසරයට ඇල්මක් දක්වන පාඨකයන්ගේ මන දොළ පුරවමිනි.

පොතට පසුවදනක් ලියන විද්‍යාමය විනාශ කොමසාරිස් ස්ටර්ලින් පෙරේරා මහතා ලියා ඇති සටහන දයාරත්න විරසේකර මහතාට මෙන්ම ග්‍රන්ථයක් සම්පාදනය කරන්න ඇති ශක්තියට ශක්ති සපයයි. "අධ්‍යාපන අමාත්‍යංශ මගින් 1970 දශකයේදී ද්විතීය පාසල් සඳහා සංවිදාතය කරන ලද ක්ෂෙත්‍ර අධ්‍යයන මධ්‍යස්ථාන වැස සටහනට දයාරත්න විරසේකර මහතා විද්‍යා අධ්‍යාපන ශිල්පාධිරිවරයකු ලෙස සම්බන්ධ විය.

"ස්ථානගත පරිසර අධ්‍යයනය" යන නමින් හඳුන්වන ලද මෙම වැඩ සටහන ඉතා ඉක්මනින් පාසල් අතර ව්‍යාප්ත විය. කතුවරයා පාසල් සිසුන් ගුරුවරුන් සහ ශිල්පාධිරීන් සමග පරිසර අධ්‍යයන කටයුතු වලට සම්බන්ධ වී පරිසර අධ්‍යාපනය පිළිබඳව පුළුල් දැනුමක් ලබා අසත. රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසුවද ඔහු අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මෙහෙයවන ලද පරිසර අධ්‍යාපන වැස සටහන් ආයියකම උපදේශකවරයකු ලෙසද සේවය කර තිබේ.

ඔහුගේ අත්දැකීම් පරිසර විද්‍යාත්මක පොතක් ලෙස සරල බසින් සිංහල පාඨකයන් සඳහා ඉදිරිපත්වීම් පිළිබඳව මගේ ප්‍රසාදය පළකරමි"

විරසේකර මහතා සිය ග්‍රන්ථයේ අන්තර්ගතය කොටස් එකොළහකට බෙදා ඉදිරිපත් කරන්නේ පාඨකයා වෙහෙස නොකරමිනි.

- අපේ වටපිටාව
- වටපිටාවේ සියළුම පරිසරයයි
- පරිසරයේ අන්තර් සබඳතා
- අපේ ආහාර පරිසරයෙහි
- ශක්තිය ලැබෙනුයේ ආහාර වළිනි
- අපගේ අපද්‍රව්‍ය මොනවාද
- පරිසරයේ පෛව විවිධත්වය
- පළය මහතු සම්පතකි
- පරිසර දූෂණය සිදුවන්නේ කෙසේද?
- පරිසරය සුරකිමු
- අපේ පරිසර කටයුතු දෙස හැරී බලමු

විවිධ ක්ෂේත්‍රයන්හි යටතේ සිය දැනුම වර්ධනය කරගන්නට බලා සිටින පාඨකයනට සිංහල භාෂාවෙන් ලියැවුණ පොත පත හිඟ වෙමින් යුගයක දයාරත්න විරසේකර මහතාගේ ප්‍රයත්නය අගැයිය යුතු ය.